# හරබර යුගයක සාහිත මතක

(මෙම ලිපියේ මුල් කොටස පසුගිය සතියේ පළවිය)

**කාව්‍යය නම් කුමක් ද, කලාවේ ප්‍රයෝජනය, විචාරය, භාෂාව, සාහිත්‍ය හා කාව්‍යය, වාචකාර්ථය හා ධ්වනිතාර්ථය, ශබ්දය හා අර්ථය, අර්ථාලංකාර, චිත්තය හාලය හා ලය, රසවාදය ඇති වචනයක් යන ශීර්ෂ පාඨ යටතේ පළ වන පරිච්ඡේද සියල්ල ගුවන් විදුලියෙන් කළ කතාය.**

"අමතක මතු පළ වන්නේ 1946 හා 1947 යන වර්ෂ දෙකෙහී මා විසින් වරින් වර ගුවන් විදුලිය මගින් ප්‍රචාරයට පවුණුවන ලද කතා පන්තියකින් මුද්‍රණයට සුදුසු වන පරිදි සකස් කළ ලිපි කිහිපයකි" යනුවෙන් හෙතෙම ඒ බව ප්‍රස්තාවනාවෙහි සඳහන් කර තිබේ.

ආචාර්ය ආනන්ද ඩබ්ලිව්.පී. ගුරුගේ 'සංස්කෘත කාව්‍ය හා නාට්‍යය' නමින් ග්‍රන්ථයක් 1950 දශකයේදී ලේඛ්. හරිදාස විසින් ප්‍රකාශයට පත්කර ඇත.

සංස්කෘත කාව්‍ය යටතේ මුල් අවධිය, කාව්‍ය සාහිත්‍යයේ නැගීම, මහාකාව්‍යය, රාමායණය, කාලිදාසයේ ගීලා ලේඛන, අන්වයෝෂ නිමියෝ, කාලිදාසගේ භාව රීත, කාලිදාසයේ මහා කාව්‍ය, භාරවී, කුමාරදාස, මාඝ සහ ශ්‍රී හර්ෂ කාව්‍යයෙහි විශේෂත්වය වැඩීම, ගද්‍ය කාව්‍ය, ඛාණ, සංස්කෘත හාවනීත, උපදේශ කාව්‍ය හා නිරීක්ෂණ කළා, සංස්කෘත සාහිත්‍යය හා ලෝක සාහිත්‍යය යන පරිච්ඡේද ද සංස්කෘත නාට්‍ය යටතේ ආරම්භය, වැදගත් නාට්‍ය, රඟපෑම, මෘච්ඡකටිකාව, ශාකුන්තලය, උත්තරරාම චරිතය යන පරිච්ඡේද ඇතුළත් මේ ග්‍රන්ථය සංස්කෘත කාව්‍ය හා නාට්‍ය පිළිබඳ හැස්කෑගර ග්‍රන්ථයකි.

"මෙහි පළ කැටි ඇත්තේ ඉවත දමාපම ලියැවුණු පොත් දෙකකි. සංස්කෘත නාට්‍යය පිළිබඳව 1952 තුළ ලංකා ගුවන් විදුලි සේවයේ ශාස්ත්‍රීය සංග්‍රහයෙන් ප්‍රචාරය කළ කතා සපතුන්, සංස්කෘත 'සාහිත්‍යයෙහි වැදගත් තැන්' යන මැයෙන් 1954 තුළ කළ කතා 13කුත් මීට ඇතුළත් වේ." යනුවෙන් ආචාර්ය ගුරුගේ හැදින්වීමේ කරුණු සඳහනින් ගුවන් විදුලි ශාස්ත්‍රීය සංග්‍රහය මෙරට සංස්කෘතික පෝෂණය උදෙසා කළ සුවිශාල මෙහෙවර එටිහාසික හැකිය.

ආචාර්ය ගුණදාස අමරසේකර 1955 දී 'විඤ්ඤාණවාදය හා විචාරය' නමින් සාහිත්‍ය විචාරය පිළිබඳ පොතක් පළ කරයි. සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සහ සමාගම පළ කළ මේ කෘතියට සාහිත්‍යය යනු කුමක් ද, යාර්තාවේ අධ්‍යාජත්වය, කාව්‍යය, කාව්‍යය යනු කුමක් ද, චර්තමාන සිංහල කාව්‍යය, නවකතාව යනු කුමක් ද, භාෂාව යන පරිච්ඡේද සහ කෙටිකතාව පිළිබඳ ලිපි දෙකක් ඇතුළත් වේ.

එහි ප්‍රස්ථාවනාවෙහි අමරසේකර මහතා සඳහන් කරයි. "මේ පොතෙහි ඇත්තේ මට්ටින් ගුවන් විදුලිය මගින් ප්‍රචාරය කරන ලද කතා කිහිපයකි."

නූතන සාහිත්‍යය හා රුසියානු ශෛලීකරණය පිළිබඳ මූලික හැඳින්වීමක් ශ්‍රාවකයන්ට ලබා දීමට ගුවන් විදුලිය මෙස්සේ යම් පියවරක් ලෙස මේය සඳහන් කළ හැකිය.

"සාහිත්‍ය රසය ග්‍රහණය පිළිගෙළ වී තිබෙන්නේ ශ්‍රී චන්ද්‍රරත්න මාහවඩිසිංහයන්ගේ ගුවන් විදුලි දේශන මාලාවකිනි. සාහිත්‍ය රසාස්වාදය උදෙසා පවත්වන ලද මෙම දේශන මාලාව, ඔහු කෙරෙහි පැවැති ශ්‍රද්ධා ශක්‍යතාලක්‍ෂණය අපහරුණය ද විදහා දක්වන්නේය. ඔහුගේ දේශනා කෞශලයය පිළිඹිබු කරන්නට ලේඛනගතව ආරක්‍ෂා වී තිබෙන එකම දේශන පෙළ මෙය වෙයි. සාහිත්‍ය දර්ශනය, සාහිත්‍ය කෘතියක රචක දර්ශනය, වචන යෙදීමේ ශක්තිය, නිර්මාණ සැයදිල්ල, බහෙති යෙදුම් ආර්, ගීතය හා ලජාව, ශලාව මධුර වන හැටි, ජීවිතයට ආශක් ගත් කලාව යන මාතෘකා යටතේ ලිපි මෙහි ඇත්තර්ගත වෙයි."

ගුවන් විදුලියේ 1957-1958 කාලයේ තම් දේශන මාලාව සාරව කටයුතු කළේ එච්.එම්. ගුණසේකර බව ද සංස්කාරක වදනෙහි සඳහන් වෙයි. මෙහි ප්‍රථම මුද්‍රණය එළිදකින්නේ 1969 දීය.

එපමණක් ද නොවේ. 1970 කාලය දක්වා ද විවිධ - හරබර වැඩසටහන් ගුවන් විදුලියෙන් ප්‍රචාරය විය. සිංහල ගැමී සංස්කෘතිය අරබයා මහාචාර්ය ජේ.කී. දිසානායක ගුවන් විදුලියට වැඩසටහන් මාලාවක් ඉදිරිපත් කරළිය. 1988 දී 'සිංහල වෙහෙර විහාර' යනුවෙන් පළ වන්නේ ඒ කතා මාලාවයි.

"සිංහල ගැමි සංස්කෘතිය පිළිබඳ තොරතුරු සමුදායක් ඉදිරිපත් කිරීමට ගුවන් විදුලි මාධ්‍යය උපකාරී විණ. මේ විෂයය අළලා සතිපතා වැඩසටහනක් මෙහෙයවන මෙන් 1979 දී ලංකා ගුවන් විදුලි සංස්ථාවෙන් ආරාධනාවක් මට ලැබිණ. ඒ අනුව 'හුන්පාන් රටා' නම් වැඩසටහනක් තුන් අවුරුදු තුන් මසක් පවත්වාගෙන යෑමට ගුවන් විදුලි සංස්ථාවේ පූර්ණ සහනුග්‍රහය මට නොමඳව ලැබිණි.

හුන්පාන් රටා වැඩසටහන අපොහොසත් වශයෙන් පළ කළ යුතුය යන අදහස මුලින්ම ඉදිරිපත් කළේ රාජ්‍ය ඇමැති ආනන්ද තිස්ස ද සල්වින් මහතාය. 1980 ඔක්තෝබර් 27 වැනි දින පාර්ලිමේන්තුවේ දී ඔහු සම්බන්ධතායන් කළ ප්‍රකාශය හැත්සාඩ් වාර්තාවේ 1826 පිටුවේ වාර්තා කොට ඇත."

නිවපු ඇමැතිවරයකු හා සභානායකවරයකු සාහිත්‍යවේදියකු වන ඩී.ජ.ඩු. ලොකුබණ්ඩාර මහතා 'රසදීපනී' මැයෙන් ඉදිරිපත් කළ සුභාවිත



මහාචාර්ය වල්පොල රාහුල හිමි



මහාචාර්ය සිරි ගුණසිංහ

ඩී.ජ.ඩු. ලොකුබණ්ඩාර

ගීතය පිළිබඳ සංකථනය එතුමන්ම 2005 දී මහාචාර්ය විමල් දිසානායකගේ හැදින්වීමක් ද සහිතව ප්‍රකාශයට පත් කර තිබේ.

1960 දී ලංකා ගුවන් විදුලියේ පාසල් සේවය වයස 16-18 දක්වා වූ වයස් කාණ්ඩයේ සිසු සිසුවන් උදෙසා ආචාර්ය සිරි ගුණසිංහ ඉදිරිපත් කළ සාහිත්‍ය විචාරය පිළිබඳ වැඩසටහන් මාලාව කොතරම් සරාගවර්ධ දැයි විමසා බැලීමට 'කරංබිනී' සඟරාවේ පළ වූ තම් වැඩසටහන් පත්‍රිකාව සලසා බලන්න.

**ශ්‍රීලංකා ගුවන් විදුලියේ පාසල් සේවය**
**සාහිත්‍ය විචාරය**
**ආචාර්ය සිරි ගුණසිංහ**

සඳුදා දිනයන්හි අපරවරු 9.25-9.45 දක්වා ප්‍රචාරය වන මෙම වැඩසටහන එදිනම පස්වරු 1.45-2.05 දක්වා නැවත ප්‍රචාරය වෙයි

**දිනය: ජනවාරි 18**
**නූතන සාහිත්‍ය යනු කුමක් ද?**

මෙම වැඩසටහනේදී නූතන සාහිත්‍යයත්, පැරැණි සාහිත්‍යයත් අතර ඇති ප්‍රධාන වෙනස්කම් මොනවාදැයි සොයා බලනු ඇත. සිංහල සාහිත්‍යයේ නූතන යුගය ඇරඹුනේ අදහස් ශෛලීකරණයත් සමඟ කුමක්දැයි හැඳින්වීමට මෙහිදී බලාපොරොත්තු වෙමු. නූතන සාහිත්‍යයේ විශේෂ අංග මොනවාදැයි විභාග අසාට නවකතා, කෙටිකතා ආදිය පැරැණි කතා සම්ප්‍රදායෙන් වෙනස් වන්නේ කෙසේද, නූතන සිංහල කාව්‍ය පැරැණි කාව්‍යයෙන් වෙනස් වන්නේ කෙසේ ද යන්න සාකච්ඡා කරනු ලැබේ.

**දිනය: ජනවාරි 25**
**වෙනස් වන සාහිත්‍ය සිද්ධාන්ත**

නූතන සාහිත්‍යය පැරැණි සාහිත්‍යයෙන් වෙනස් වී පෙනෙන්නේ මොන මොන කරුණු නිසා ද යන ප්‍රශ්නය විමර්ශනය කිරීමට මේ වැඩසටහනෙන් උත්සාහ කරමු. නූතන රචකයන් පැරැණි කාව්‍යයෙන් සාහිත්‍යයේ පරමෝර්ථය කුමක්දැයි වටහා ගත් අයුරු එකිනෙකට වෙනස් වීම, නූතන සාහිත්‍යයේ දිවිය හැකි විශේෂත්වයට ප්‍රධාන හේතුවකි. මේ කරුණු පිළිබඳ විස්තර වියයෙන් සාකච්ඡා කරනු ලැබේ.

**දිනය: පෙබරවාරි 1**
**නූතන සාහිත්‍යයේ පදනම**

19 වන ශතවර්ෂයේ මැද භාගයේදී ඇති වූ ජාතික පුනර්ජීවනය නිසා ජාතික සභ්‍යත්වය, සාහිත්‍යය, ආගම සැදී දේ පිළිබඳ උද්දේශ්‍යයක් ඇති වීම, ජාතික අදහස් ප්‍රකාශ කිරීමට උපකාරීවූ පත්තර සඟරා ආදිය පිරිවෙන් අධ්‍යාපනය නිසා පැරැණි සාහිත්‍ය උගතුන්ගේ සැලකිල්ලට ලැයිමු වීම, ශාස්ත්‍රීය වාද විවාද

දිනය: පෙබරවාරි 8

**සිංහල සාහිත්‍යය කෙරෙහි වූ විදේශ සාහිත්‍ය බලපෑම**

ඉංග්‍රීසි අධ්‍යාපනය පැතිර යාම. ඉංග්‍රීසි අධ්‍යාපනයේ ප්‍රතිඵල විශේෂයෙන්ම දිවිය හැක්මේ නවකතාවේ ප්‍රභවය හා සංවර්ධනය ගැන සිතා බලමු. බයිබලය, ආරාබි නිශාසාද්‍රාපාසය, ඊසොප්ගේ උපමා කතා ආදියේ පරිවර්තන නිසා නවකතාකරණයට ලැබුණු රුකුල. පතු සඟරා ආරම්භයත් සමඟ වූ ඉඟුණු ප්‍රභාවයක් කතා නිසා සිංහල පරිකයාගේ රුචිය වෙනස් වීම.

ගුවන් විදුලි කලාවේ ප්‍රවර්ධනයට ඇම්.ජේ. ගඩෙමර්රා, පීරිස්ලේ තිලකරත්න, විත්සාන්ට් පණ්ඩිත, සරත් අමුණුගම ආදීහු ද සංගීත කලාවේ ප්‍රවර්ධනයට දේවාර් සූර්යසේන, ඕසුබෙට් රාජපක්ෂ, සරණංකුප්ත අමරසිංහ, ලියනල් එදිරිසිංහ, ඩබ්ලිව්. බී. මෙතුලොලුව, ජී. ඩන්ස්ටන් ද සිල්වා, එඩ්වින් සමරදිවාකර, සුනිල් සාන්ත, අමරදේව, ඕ. ද ඇස්. කුලතිලක ප්‍රධාන සංගීතඥයෝ ද දැනුම් ප්‍රවර්ධනයට ඉණපාල මලලසේකර, මහින්ද රණවීර, නාන්දදේව ජයකොඩ්ගාවේ, ශසතාරත් පරණවිතාන, මාර්ටින් වික්‍රමසිංහ, ශ්‍රී චන්ද්‍රරත්න මාහවඩිසිංහ, සී.ටී. ගොංඩකුඹුරේ, ආචාර්ය ආනන්ද ගුරුගේ, ඩී.ඊ. හෙට්ටිආරච්චි ආදීහු ද බෞද්ධ ආගමික චින්තනය ප්‍රවර්ධනයට පැළැඹෙන් ගිරි වල්ලපිටාණ නාහිමි, හාරදූ ඛිමි, පියදස්සි හිමි ප්‍රමුඛ සඟරුවන ද කිතුනු ආගමික චින්තන ප්‍රවර්ධනයට ජෝ ක්වින්ටස් පියතුමා, එස්.ඇන්. ද එස් වීරසිංහ ඉද්වාහැනිතුමා, එඩ්මන්ඩ් පීරිස් රදගුරුතුමා, ඔස්වල්ඩ් ගොම්ස් රදඉතුරුතුමා ඇතුළු පියවරු ද කුරාණය සිංහලෙන් කියවූ එච්.එස්.එම්. සලාහුදීන් ද මුස්ලිම ඉද්වස්ථානවල ආගමික උත්සව, ශුද්ධ කුරාන් විවරණය වැඩසටහන් ද ප්‍රචාරය විය.

නාට්‍ය ප්‍රවර්ධනයට එදිරිවීර සාරච්චන්ද්‍ර, සී. වැලිකල, ඒ.ඒ. ගුණරත්න, සී.කේ.ඩී. සෙනෙවිරත්න, මුදලිනායක සෝමරත්න, මර්විස් ගුණවර්ධන, සුගතදාස ද සිල්වා, දයානන්ද ගුණවර්ධන, ආනන්ද සිරිසේන ආදීහු ද දායක වූහ.

ශ්‍රීරාට ගුවන් විදුලි මාධ්‍යය 1940 දශකයේ සිටම නාට්‍ය, සංගීත කලාදිය පෝෂණයට ද බෙදු. කිතුනු, හින්දු, ඉස්ලාම් ආගමික චින්තනයට ද දැනුම හා අධ්‍යාපනය ලබාදීම පිණිස ද කළ මෙහෙවර දීර්ඝ ගවේෂණයකින් සොයාගත යුතුව ඇත. නූතන ගුවන් විදුලි ශාස්ත්‍රාචාර්යගේ නිසරු, අරුන් සුන්, කල් මරන වැඩසටහන් ආකෘති විවිධ බිලත හිට ගුවන් විදුලියේ අසිත වැඩසටහන් ආකෘති කොතරම් අර්ථ සම්පන්න දැයි සංස්කෘතික මිනිසුන් තීන් කිරීමට කොතරම් වැදගත් දැයි පසක් කරගත හැකිය.

## තිලකරත්න කුරුවිට ඛණ්ඩාර